දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2016 පරීක්ෂණය (2014 පුනර්) - 2017 පෙබරවාරි/මාර්තු
First Examination in Arts (External) 2016 (Repeat 2014) – February/March 2017

බෞසංප්‍ර 1.2 - බෞද්ධ සංස්කෘතික සංකල්ප
BC 1.2- Concepts of Buddhist Culture

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

---

01. “මූලික බුද්ධ දේශනා සියල්ලම හේතුඵලවාදි න්‍යාය මත පදනම්ව පවතී” සකාරණව විවරණය කරන්න.

02. බෞද්ධ සදාචාරාත්මක මිනුම් දඬු ලෙස පුණ්‍ය - පාප, කුසල - අකුසල සංකල්පයන්හි වැදගත්කම මූලාශ්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. “බෞද්ධ කලාවේ මුඛ්‍ය පරමාර්ථය බුදුදහමෙහි දාර්ශනික ඉගැන්වීම් පොදු ජනතාවට සමීප කරවීමයි” විමසන්න.

04. සෞන්දර්ය රසාස්වාදය පහසු විහරණයට උපස්ථම්භක වන අයුරු සෞන්දර්ය සංකල්පය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් පැහැදිලි කරන්න.

05. “යුද්ධයෙහි ආදීනව මිනිය යුත්තේ හානි වූ මිනිස් ජීවිත ගණනින් නොව සදාචාරාත්මක පරිහානියේ ප්‍රමාණය පාදක කොට ගෙනය” පශ්චාත් යුද සමයෙහි අත්දැකීම් බෞද්ධ ඉගැන්වීම් හා සසඳමින් මෙහි සත්‍යාසත්‍යතාව පෙන්වා දෙන්න.

06. ප්‍රීතිමත් දිවියකට සමජීවිකතාවෙහි ඇති වැදගත්කම බෞද්ධ ආර්ථික දර්ශනය ඇසුරෙන් පැහැදිලි කරන්න.

07. “බෞද්ධ දේශපාලන දර්ශනයේ දී කේන්ද්‍රීය අවශ්‍යතාව වන්නේ සදාචාරාත්මක දෘෂ්ටියෙන් හෙබි පාලකයෙකි” බෞද්ධ රාජධර්ම ඇසුරෙන් සාකච්ඡා කරන්න.

08. සත්‍යාන්වේෂණයේ දී වීමංසනයෙහි හා ප්‍රත්‍යවේක්ෂණයෙහි වැදගත්කම අදාල මූලාශ්‍රය ඇසුරෙන් පෙන්වා දෙන්න.

(එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගිනි)

**************************************